# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/15 - 2020 අගෝස්තු මස 11 වැනි අඟහරුවාදා - 2020.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් මස 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2009.10.02 වන දින අංක 1622 දරන *ගැසට් පත්‍රයේ* ද පළවූ බදුල්ල කතරගම දේවාලයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් ඩී. එම්. එල්. එච්. දිසානායක වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2020 වර්ෂයේ බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

01. 2020 අගෝස්තු මස 20 වන දින අළුයම කප් සිටුවීමෙන් බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වී, 2020 අගෝස්තු මස 20 වන දින සිට අගෝස්තු මස 23 වැනි දින දක්වා (දින 04) අභ්‍යන්තර පෙරහැර, 2020 අගෝස්තු මස 24 වැනි දින සිට අගෝස්තු මස 28 වැනි දින දක්වා (දින 05) කුඹල් පෙරහැර, 2020 අගෝස්තු මස 29 වැනි දින සිට සැප්තැම්බර් මස 02 වැනි දින දක්වා (දින 05) රන්දෝලි පෙරහැර, 2020 සැප්තැම්බර් මස 03 දින අළුයම දිය කැපීමේ මංගල්‍ය, 2020 සැප්තැම්බර් මස 03 දින දහවල් පෙරහැර ගෙවදීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

02. **පෙරහැරේ ගමන් මාර්ගය :-**

2020.09.03 වැනි දින පමණක් බදුල්ල කතරගම දේවාලයේ සිට පහල වීදිය ඔස්සේ මුතියංගණ රජ මහා විහාරයටද, ඉන් පසු මුතියංගණ රජමහා විහාරයේ පෙරහැර පෙරටුකොට ගෙන බැංකුව පාර, අනගාරික ධර්මපාල මාවත, සැන්සි පාර, රජ වීදිය, තැපැල් කන්තෝරු පාර හරහා සිංහාසනය වෙත පැමිණීමට නියමිතව ඇත.

03. බදුල්ල කතරගම දේවාල භූමිය හා දේවාලයට අයත් සිංහාසනය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

04. පෙරහැර කාලය තුළදී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මගෙන් හෝ දේවාල භාර නිළමේතුමාගෙන් බලපත්‍රයක් නොමැතිව දේවාල භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

05. පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළඳුන් විසින්

1A - G 32651 — 18 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දේවාල පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා දේවාල භූමිය තුළ පොලිතීන් ඇතුළු සියළුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

06. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

07. කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

08. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

09. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිළධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 03 හි දක්වෙන කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

**ඩී. එම්. එල්. එච්. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2020 අගෝස්තු මස 11 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 561

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.